# ඇඩ්ස්

ජගත් ජේ එදිරිසිංහ ලියයි

19

**සෝමදාස ගේ මාලු ලෑල්ල අසළ සිටම පෙළපාලියේ පෙරමුණ බණ්ඩාරට ය. රට ගොඩ නැගීම කෙසේ වෙතත් දාහතේ වත්තේ දැවෙන අවශ්‍යතා සියල්ල වහා සම්පූර්ණ කරන්නට දැන් ඉතින් තමන්ට හැකියාව ලැබෙනු ඇතැයි බණ්ඩාර සිතයි. පාරවල් තාර දමන්නට, පොදු වැසිකිළිය පිළිසකර කරන්නට, ළමා ක්‍රීඩාංග නය නැවත ගොඩ නගන්නට.. අවුරුද්ද තිස්සේම උතුරා ගඳ ගසන කාණු සිමෙන්තියෙන් නැවත බඳින්නට.. මේ සියල්ලෙන් පසු සමෘද්ධිමත් ලංකාවක් බිහි කරන්නට මේ රජය මෙහෙයවන්නට තමන්ට හැකියාව ලැබෙනු ඇති බව නිසැක ය.**

වෙල්යායේ වම්පස කෙළවරේ විශාල ප්‍රදේශයක් අලුත දැමූ පසින් වැසී යමින් ඇත. පහත් බිම් ගොඩකරන්නට අවසර නැතැයි කොයි තරම් කියනු ඇසුණා ද දවසින් දවස මේ පුරන් වෙල්යාය කුඩා වෙමින් තිබෙයි. එයට ඔබ්බෙන් ඇති අලුත තැනූ සුවිසල් මන්දිර මහත් අභිමානයකින් නැගී සිටින්නේ තුරු නිල්ල වසා දමමින් ය. කලකට ඉහත මේ වෙල්යාය හරහා හමා ගිය සිහිල් සුළඟ දැන් විඳින්නට නොහැකි වී ඇත්තේ මේ මන්දිර පවුර නිසා විය යුතුය.

පුරන් කුඹුරු යාය අතරේ තැනින් තැන ඉදිව ඇති අනවසර පැල්පත් අසල කොලු කුරුට්ටන් කීප දෙනකු දුව පනිමින් සිටින්නේ තමන් අවට සිදුවෙමින් පවතින කිසිදු සිදුවීමක දැනීමක් හැඟීමක් නොමැතිව ය.

වෙල්යායට බරව නැගී සිටින කැන්ද ගසට දකුණත තබා ඈත බලා සිටි සුනන්ද ආපසු හැරී අනුර දෙස බලන්නේ නොසඟවාගත් සුසුමක් පිට කරමින් ය.

"මං අසූ අටේ අසූ නමයෙ ඕනෙ තරම් ඩෙඩ් බොඩීස් දැකලා තියෙනවා සුනන්ද.. ඒත් මේ තරම් කම්පනයක් මට කවදාවත් දැනිලා නැහැ.. "

සුනන්ද පොලිස් නිල රථයට දකුණුපසින් පොළොව පිළිස්සුණ ලකුණ දෙස බලා සිටියි. ටයරයක සළකුණ තවමත් පිළිස්සුණ තණ පත් මතින් දැක ගත හැකි ය. පිළිස්සුණ තණපත් වලට මෑතින් එකමෙක කහ පැහැ කුඩා මලක් පිපී තිබෙයි.

"මං ඊකාලෙ හිටියෙ අකුරැස්ස පොලීසියෙ.. මිනිස්සු කොයි තරම් එක එක කතන්දර කිව්වත් පොලිස්සියෙ හිටිය අයගෙන් වැඩි දෙනක් මිනී මැරුවෙ නැහැ.. ඒ වැඩේට වෙනමම කාණ්ඩයක් හිටිය.. උන්ගෙ අමනුස්ස ක්‍රියාකලාප අනුමත නොකළ අය ගොඩක් හිටිය.. නිශ්ශබ්දව බලාගෙන.. කටක් ඇරල විරෝධයක් දක්වන්න බයේ.. උඹට ඒක තේරුම් ගන්න පුලුවන්ද මන්දා.. පොලිස්සියෙ අයත් බයෙන් තමයි හිටියෙ.. බල්ලොත් බල්ලන්ට බය වෙලා හිටිය කාලයක් ඒක... දඩබල්ලො රෑට දස වද දීලා දූෂණය කරලා මරා දාන කොල්ලන්ගෙ කෙල්ලන්ගෙ බොඩීස් අපි උදේට එකතු කළා... හිත ඇතුලෙන් සාප කරමින්.. අප්පිරියාව වැඩි කමට අපි නොකා හිටිය දවස් තිබුණා.. කන්න බැහැ.. අරව මතක් වෙනව.."

අනුර සුනන්ද පසුකර පාර හරහා වෙල දෙසට යයි. කලකට පෙර ඇල මාර්ගයක්ව තිබෙන්නට ඇතැයි අනුමාන කළ හැකි පටු බිම් තීරුව වල් හබරල ගසින් වැසී තිබෙයි. කිසියම් සතකු ඒ හරහා ගමන් කිරීම නිසා හබරල කොළ යායේ ඇතිවන සෙළවීම ක්‍රමයෙන් ඈතට ඇදී යයි. ඒ දෙසින් කිසියම් කුරුල්ලෙක් කෑ ගසමින් අහසට නගිනු පෙනෙයි.

"එදා දැනුණ කම්පනයට වඩා සිය දහස් ගුණයක කම්පනයක් අද මට දැනෙනවා.. ඇයි ද මං දන්නෙ නැහැ.. සමහර විට අද මං එදාට වඩා අවුරුදු කීපයකින් හරි වයස් ගත වෙලා නිසා වෙන්නැති.. එහෙමත් නැත්නං ඒ වගේ භීෂණයක් ආයෙ අපේක්ෂා නොකරන නිසා වෙන්න ඇති... අයේෂගෙ බොඩිය අඳුනගත් වෙලාවෙ ඒ අම්මා අඬපු ඇඬිල්ලට මගේ හිත කීරි ගැහිලා ගියා... මගෙ පොලිස් ජීවිතේ පළමු වතාවට මට මං ගැනම කළකිරීමක් ආවා.. අපි රකින බම්බු නීතිය ගැන.. ඕනෙ වේසිගෙ පුතෙකුට තව කෙනෙක් මරල දාලා අත පිහදාගෙන යන්න ඉඩ දෙන මේ පාහර ක්‍රමේ ගැන.. උන්ව ආරක්ෂා කරන අපේ මේ අසික්කිත පොලිසියෙ නිලධාරියෙක් වීම ගැන... "

සුනන්දට අයේෂා ගේ කෙළිලොල් සිනාව සිහිවෙයි. ඇගේ දිවිය පුරා ප්‍රදර්ශණය කළ අපූරු හෘදයංගම බව සිහිවෙයි. ඇගේ දෑසේ නිබඳ රැඳීගත් විසේකාර බැල්ම, කිසිවකු නැති විට ඇගේ දැවටෙන්නටම සැරසුණ ඇගේ සැහැල්ලු චර්යා රටාව අමතක වන්නේ කෙසේ ද?

"කෙල්ලගෙ ඔලුවට එකම එක වෙඩිල්ලයි තියල තියෙන්නෙ.. මෙතනදිම.. අපට පතුරොම් කොපුව හමුවුණා.. උණ්ඩෙ ඔලුවෙ හිර වෙලා තිබුණා.. උඹ දන්නවද සුනන්ද ඊකිට බබෙක් හම්බවෙන්න හිටිය බව..? "

ඒ හෙළිදරව්ව සුනන්ද ගේ සිත සසළ කරයි. අයේෂාට දරුවකු ලැබෙන්නට සිටියා නම් ඒ දරුවාගේ පියා කව්දැයි තේරුම් ගැනීම ඔහුට අපහසු කාරණායක් නොවේ.. තමන් අවසන් වරට අයේෂා හමු වූ මොහොතේ ඇය කියන්නට උත්සාහ කළේ ඒ කාරණය විය නොහැකි ද? මේ මිනීමැරුම පිටුපස සිටින්නේ රණසිංහ ද? උණ්ඩය පත්තු වූයේ අජිත් අතින් විය නොහැකි ද?

"පෝස්ට් මෝටම් එකේදි කෙල්ලගෙ බඩේ දරුවෙක් කියලා ඩොක්ට කිව්වම කෙල්ලගෙ අම්ම සිහිය නැතිව වැටුණා.. අයේෂට මැරුම් කන්න වුණෝ මේ දරුවා නිසා ද? එහෙමත් නැත්නම් මරපු උන් ඒ බව දැනගෙන හිටියෙ නැද්ද? "

අනුර අවසන් වචන කීපය කීවේ සුන්නදට මුහුණට මුහුණ ලා සිට ගනිමින් ය. පොලිස් නිලධාරියාගේ තීක්ෂණ ඇස් තමා වෙතම යොමුව තිබෙනු හිස ඔසවා බලන සුනන්ද දකියි.

"ඒ කෙල්ල රණසිංහ මන්ත්‍රී එක්ක සම්බන්ධයක් තිබුණා.. මං හරි ද..? සෙකට්‍රි හැටියට නෙවෙයි.. එයිට වඩා සමීප සම්බන්ධයක්.. උඹත් ඒක නොදැනගෙන ඉන්න විදිහක් නැහැ.. ඒ කාලෙ රණසිංහගෙ දකුණු අත උඹනෙ.."

සුනන්ද සුසුමක් හෙළා ඉවත බලා ගනියි. රණසිංහ පාවා දීමට නොහැකි බවක් තේරුම් ගත නොහැකි ලෙස ඔහුට දැනෙයි. රණසිංහ කිසිදිනෙක තමා සමග කෙළින් කතා නොකළ නමුදු තමා හොඳින්ම දැන සිටි මේ කරුණ නැවත හාරා අවුස්සා කතා කරන්නට නොහැකිය. තමා අතින් කිසි දිනෙක එය හෙළි නොවනු ඇතැයි රණසිංහ තැබූ විශ්වාසය බිඳින්නට නොහැකි බවක් සුනන්දට දැනෙයි. ගුණමකුවකු විය නොහැකි ය. කිසිවක් සැඟවීමේ අර්ථයක් නැති වුවද ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වී දන්නා සියල්ල හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවක් ඇති බවක් ඔහු නොදකියි. මෙය තමා පැටලිය යුතු ගණුදෙනුවක් සේ ඔහුට නොපෙනෙයි.

"මං දන්නෑ සර්... ඕව ගැන මට කියන්න දෙයක් නැහැ... සර්ලට අවශ්‍ය දේවල් හොයාගන්න අමාරු වෙන එකක් නැහැ.. ඔය වගේ කාරණා රහස්‍ය කියලා හිතං හිටියට හුඟක් වෙලාවට රහස් නෙවෙයි.."

පොලිස් නිලධාරියා විඩා බර දෑසින් සුනන්ද දෙස බලයි. පිළිතුරත් ලෙස යමක් කියනු ඇතැයි සුනන්ද බලාපොරොත්තු වුව ද හේ නිහඬවම සිය වාහනය වෙත පිය නගයි.

"මං හොයාගන්නවා.. ඊකෙ දෙකක් නැහැ.. දරුවා රණසිංහගෙ නං ඩීඑන්ඒ ටෙස්ට් එකකින් මං ඒකත් ඔප්පු කරනවා.." අනුර එවැන්නක් සිතන්නට ඇතැයි සුනන්ද අනුමාන කරයි. රණසිංහගේ බල පරාක්‍රමය අභිබවා යන තුරුම්පුව අවසන පොලිස් නිලධාරියා අතට පත්ව තිබෙයි. අතේ ඇති තුරුම්පුව පාවිච්චි නොකර සිටින්නට තරම් පොලිස් නිලධාරියා අනුවණ නොවන ඇත. රණසිංහ ගැලවී ගත නොහැකි තරමේ අසීරුවකට වැටෙනු ඇති බව සුනන්ද නිසැකවම දනියි.

00000000

රණසිංහ ඡන්ද ගණන් ගන්නා ශාලාවෙන් පිටතට එන්නේ කෝපයෙන් වියරු වැටුණාකු සේ ය. මේ ප්‍රතිඵලය ඔහු කිසි විටෙකවත් අපේක්ෂා නොකළ එකකි. ජයග්‍රහණය ලැබූ ආණ්ඩුවක තමන්ගේ ආසනය අහිමි වීමේ වේදනාව දරා ගත නොහැකි තරම් විශාල ය.

"සර්ලගෙ මල ඉලව් සන්දානෙන් කෙළව ගත්තෙ අපිම නේද සර්..? අන්තිමේ අපේම ඡන්ද අපි අනුන්ට පූජා කළා.. වෙස්සන්තරලා වගේ.. අන්තිමේ අපේ පක්ෂෙ උන්ගෙ මනාප වලින් වෙනින් පක්ෂ වල එවුන් පාර්ලිමේන්තු යනවා.. අපි ගෙදර යනවා.. ලක්ෂ ගණන් සල්ලි විසි කරලා අපි අනුන්ට පාර්ලිමේන්තු සීට් ගොඩ ගහලා දුන්නා.. මොන මගුලක්ද සර්ල මේ කළේ..? ශාලාවෙන් පිටවන්නටත් පෙරම ඔහු ප්‍රඥාරත්නගෙන් අසයි.

අවසන් ඡන්ද ප්‍රතිඵලය ප්‍රඥාරත්න පවා කිසිදිනෙක අපේක්ෂා නොකළ එකකි. ගිය වතාවේ ආසන දෙකක් පමණක් තිබූ සන්ධානයේ එක් පක්ෂයකට මේ වතාවේ ආසන තිස් ගණනක් හිමි වනු ඇතැයි කෙසේ නම් අනුමාන කරන්නද? බෝනස් ආසන සමග ඒ ගණන හතළිහ පනිනු ඇත. යම් තැනක යම් වැරදීමක් සිදුව ඇති බව පමණක් ඔහුට දැනෙයි.

"මාත් මේ ඔලුව අවුල් වෙලා ඉන්නෙ අයිසෙ.." ප්‍රඥාරත්න ගේ කටහඬෙහි වෙනදාට ඇති උද්යෝගය පහව ඇති සේ ය. "මටත් හරිම කණගාටුයි රණසිංහ තමුසෙගෙ සීට් එක ගිය එක ගැන.. මං හීනෙකින් වත් ඒක බලාපොරොත්තු වුණේ නැහැ.." ප්‍රඥාරත්න කියන්නේ සත්‍යය නොවේ. රණසිංහ ගේ අසුන අවදානමක ඇති බව ඔහු කල්තබාම අවබෝධකරගෙන සිටියේ ය. ඒ බව හෙළිදරව් කළා නම් ඒ අයෝමාට පමණකි.

"මේ වතාවේ රණසිංහයා කෙළව ගන්නවා.. මිනිහට කාගෙවත් ඒ හැටි ප්‍රසාදයක් පේන්නෙ නෑ.." ඔහු වතාවක් දෙකක් අයෝමාට කිවේ ය. ".. මිනිහ පැරදුනොත් වෙනින් සංවිධායකයෙක් පත් කරන්න වෙයි.. අයෝමට වුණත් බැරි නැහැ එතනට එන්න.."

"උන් අපේ අස්සයා පිට නැගලා නේරංජාව පැන්නා.. අන්තිමේ පක්ෂෙට මේ තරම් කාලයක් දරදිය ඇද්ද අපි නිකම්ම බිලිබෝයිස්ලා වුණා.. අපේ කරට අඩිය තියලා උං ස්ටේජ් එකට නැග්ගා.. මේව සර්ල හිතා මතා කළ වැඩ.. එහෙමත් නැත්නං ගොං කමට කළ වැඩ.. මේ සන්ධාන ගැහිල්ල ගොං කමට කළ වැඩක්..."

"පිස්සු කතා කියන්න එපා බං.. අපේ අය කීපදෙනෙක් පැරදුන එක වෙනම දෙයක්.. ඒත් සන්ධානෙ නොතිබුණා නං ආණ්ඩුව දිනන්නෙ නෑ... දැං කලබල නොවී කල්පනා කරමු මේකෙන් ගොඩ එන්ඩ ක්‍රමයක්.. විසඳුමක්... දඟලලා කෑ ගහලා හරියන්නෙ නැහැනෙ.."

"මගෙං කුණුහරුප අහගන්ඩ එපා සර්... රෙද්දෙ විසඳුම්... කෝච්චිය ගියාට පස්සෙ මොන රෙද්දක් කරන්ඩද...?"

"අමතක කරන්නඩ එපා දැන් ආණ්ඩුව අපේ.. අපට මොනාද දැන් කරන්ඩ බැරි..?"

"බම්බුවක් කරයි.... දැං ඉතින් නටපියව් උන්ගෙ රිමෝට් කන්ට්‍රෝල් එකේ පදේට.." අනෙක් කෙළවරින් දුරකතනය විසන්ධි කෙරෙනු රණසිංහට ඇසෙයි. රැස්ව සිටිනා පාක්ෂිකයන්ගේ මුහුණු නොබලාම ඔහු වාහනයට ගොඩ වන්නේ දොර කැඩී යන තරම් තදින් වසා ගනිමින් ය.

"මිනිස්සුන්ට ස්තුති කරලා වචනයක් කතා කළා නම් නේද හොඳ?" අජිත් අසන්නේ කිසිවකුට නෑසෙන තරම් පහත් හඬිනි.

"ඇයි..? ස්තුති කරන්නෙ පැරැද්දුවටද..? ස්ටාට් කරනව ඕයි වාහනේ.. ප.." රණසිංහ කතාව අවසන් කරන්නේ අසැබි වදනකිනි.

රියැදුරා කතා බහකින් තොරව රිය පන ගන්වා ඉදිරියට ගනියි.

අයේෂා පිළිබඳව පොලීසිය තමාගෙන් විමසූ බව රණසිංහට දන්වන්නට අජිත්ට නොසිතෙයි. එය ඉක්මණින් හෙළිදරව් කළ යුතු ආරංචියක් වුව ද මුණිවත රකින්නට ඔහු තීරණය කරයි. එය හැම අතින්ම ඇඟට ගුණ ය.

0000000

"අයේෂගෙයි රණසිංහගෙයි සම්බන්ධය මම දැනගෙන හිටියා.." වින්ධ්‍යා කියන්නේ කවුළුවෙන් එපිට බලාගත්වනම ය. මන්දග ාමී ලෙස ගලා යන ඇල මග මැතිවරණය වෙනුවෙන් එල්ලන ලද විවිධ වර්ණ කොඩි වැල් වලින් සැරසීගත් කොට්ටම්බා ගස් අතරින් ඇයට පෙනෙයි. උඩුකය නිරුවත් කොලු ගැටයෙක් පරණ ටයරයක් පෙරළමින් ඇල බැම්ම මත දුව යයි. වින්ධ්‍යා කවුලුවෙන් මෑත්ව සුනන්ද දෙස හැරී බලයි. "..ඒක ඔයාවත් මට කිව්වෙ නැහැ.. ඒත් මම දැනගෙ න හිටියා.."

"මං කවදාවත් කාගෙවත් ඕපාදූප කතා කරන්නෙ නෑ කියල ඔයා දන්නව.."

"ඔයාගෙන් ඇහුවෙ නැතුවට රණසිංහගෙ ජීවිතේ ගැන හැම දෙයක්ම මං දන්නව.. ඒ මිනිහ කොයි තරම් දෙබිඩි ජීවිතයක් ගෙවනවද කියන එක මට රහසක් නෙවෙයි..

අනෙක් පිටුවට